ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ
***

**පුවත්පත් නිවේදනය**

**ඉන්දියානු ජනතාවගෙන් ඇ. ඩො. මිලියන 16ක් වටිනා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය තොගයක්**

ඉන්දියානු ජනතාව විසින් පරිත්‍යාග කරන ලද ශ්‍රී ලංකා රුපියල් බිලියන 2ක් වටිනා මානුෂීය ආධාර තොගයක් 2022 මැයි 22 වන දින කොළඹට ළඟා වීමට නියමිතය. සහල් මෙට්‍රික් ටොන් 9,000ක්, කිරිපිටි මෙට්‍රික් ටොන් 50ක් සහ ඖෂධ සහ වෙනත් වෛද්‍ය සැපයුම් මෙට්‍රික් ටොන් 25කට අධික ප්‍රමාණයක් මහ කොමසාරිස් ගෝපාල් බාග්ලේ මහතා විසින් ශ්‍රී ලංකා රජයේ ජ්‍යෙෂ්ඨ නායකයන්ට භාර දෙනු ඇත.

2. මෙම භාණ්ඩ තොගය රැගත් නෞකාව 2022 මැයි 18 වන දින තමිල් නාඩු මහ ඇමති එම්. කේ. ස්ටාලින් මහතා විසින් චෙන්නායි වරායෙන් පිටත් කර එවන ලදී. තමිල් නාඩු ප්‍රාන්ත රජය විසින් ලබා දීමට නියමිත සහල් මෙට්‍රික් ටොන් 40,000ක්, කිරි පිටි මෙට්‍රික් ටොන් 500ක් සහ ඖෂධ විශාල ප්‍රමාණයක පළමු තොගය මෙයයි. මෙම ආධාර තොගයේ වටිනාකම ශ්‍රී ලංකා රුපියල් බිලියන 5.5කට අධික වේ.

3. මැයි 22 වන දිවයිනට ළඟා වන භාණ්ඩ තොගය ශ්‍රී ලංකා රජය විසින් උතුර, නැගෙනහිර, මධ්‍යම සහ බස්නාහිර ඇතුළු දිවයිනේ සෑම ප්‍රදේශයකම ප්‍රතිලාභීන්ට බෙදා දෙනු ඇත. මෙහි දී සමාජයේ විවිධ කොටස් නියෝජනය කරන ජනතාව ආවරණය කෙරෙනු ඇත.

4. ඉන්දියානු ජනතාව විසින් ලබා දෙන මෙම සහයෝගය ශ්‍රී ලංකාවේ සහෝදර ජනතාව සමඟ රැඳී සිටීමට ඉන්දියානු රජය විසින් ගනු ලබන විවිධාකාර ප්‍රයත්නයන් හා මනාව සමපාත වේ. ඉන්දියාවේ පෞද්ගලික සමාගම් සහ සමාජ සුබසාධන ආයතන රැසක් ශ්‍රී ලංකාවේ විවිධ හදිසි අවශ්‍යතා ඉටු කිරීම සඳහා සහයෝගය ලබා දී ඇත. ඉන්දියානු රජය විසින් මෙම වසරේ ජනවාරි මස සිට මේ දක්වා ශ්‍රී ලංකාවට ඇමරිකානු ඩොලර් බිලියන 3.5ක පමණ ආර්ථික සහයෝගයක් ලබා දී ඇති අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් සාමාන්‍ය ඉන්දීය ජනතාව ලබා දෙන ආධාර ඉන්දීය රජයේ එම ආධාරයන්ට අමතරව වීම විශේෂත්වයකි. තවද ඉන්දීය රජය විසින් ශ්‍රී ලංකාවට ඖෂධ, වියළි අහාර යනාදී විවිධ ආධාර ප්‍රදාන වශයෙන් ලබා දී ඇත.

***

කොළඹ
2022 මැයි 20